මුදල් අමාත්‍යාංශය
සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
நிதி அமைச்சு
சமுர்த்தி, வதிவிடப் பொருளாதார, நுண்நிதிய, சுயதொழில், மற்றும் வியாபார அபிவிருத்தி இராஜாங்க அமைச்சு
Ministry of Finance
State Ministry of Samurdhi, Household Economy, Micro Finance, Self Employment and Business Development

1 වන මහල, සෙත්සිරිපාය අදියර II, බත්තරමුල්ල. 1 ஆவது மாடி, செத்சிறிபாய கட்டம் II, பத்தரமுல்லை. 1st Floor, Sethsiripaya Stage II, Battaramulla.

අමාත්‍යාංශ කාර්යාලය / அமைச்சு அலுவலகம் / Minister General Office : 011 - 2887 349, 011 - 2887 350
ෆැක්ස් / பெக்ஸ் / Fax : 011 - 2884 613
වෙබ් අඩවිය / இணையத்தளம் / Website : www.socialemwelfare.gov.lk

මගේ අංකය / எனது இல / My No. :
ඔබේ අංකය / உமது இல / Your No. :
දිනය / திகதி / Date : 2020 – 12 - 15

**ප්‍රවෘත්ති නිවේදනය**

## යහපාලන සමයේ නව සමෘද්ධි ප්‍රතිලාභීන්ට හිමිකම් පත් ලබා දීමේ දී සිදු වූ අක්‍රමිකතා සොයන්න පංච පුද්ගල කමිටුවක්.

යහපාලන සමය තුළ දී නව සමෘද්ධි ප්‍රතිලාභීන්ට හිමිකම් පත් ලබා දීමේ දී සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව තුළ සිදු වූ බව කියන අක්‍රමිකතා පිළිබඳ සොයා බැලීම සඳහා විෂය භාර රාජ්‍ය අමාත්‍ය ෂෙහාන් සේමසිංහ මහතාගේ උපදෙස් පරිදි කමිටුවක් පත් කර තිබේ. දැනට එම අමාත්‍යාංශයේ සහ සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු නිලධාරීන්ගෙන් සැදුම්ලත් මෙම කමිටුවේ සාමාජික සංඛ්‍යාව පහකි.

2019 වසරේ දී නව ප්‍රතිලාභීන් හාර ලක්ෂ තිස් තුන් දහස් පන්සිය අනූ හතර දෙනකු එක් කර ගැණුන අතර එහි දී සිදු කළ වියදම් පිළිබඳ ලද පැමිණිලි හේතුවෙන් රාජ්‍ය අමාත්‍යවරයා මෙම කමිටුව පත් කර තිබේ. ඒ අනුව ප්‍රතිලාභීන් වෙනුවෙන් හිමිකම් පත්‍ර සහ ගොනු ලක්ෂ හයක් මුද්‍රණය කිරීම, අමාත්‍යවරයාගේ සහ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ පණිවිඩ මුද්‍රණය කිරීම සඳහා රුපියල් මිලියන අටකට අධික මුදලක් වැය කිරීම, පෝස්ටර් ලක්ෂ හතරක් මුද්‍රණය කිරීම, රුපියල් මිලියන 170ක් වැය කරමින් උත්සවය සඳහා තාවකාලික මඩු ඉදි කිරීම සහ මුද්‍රිත ටී ෂර්ට් ලබා දීම සඳහා රුපියල් කෝටි හයකට අධික මුදලක් වැය කිරීම සම්බන්ධයෙන් විමර්ශනය කිරීම මෙම කමිටුවේ කාර්ය භාරයයි.

ලබන වසරේ ජනවාරි මස 31 දින හෝ ඊට පෙර අදාළ කමිටු වාර්තාව විෂය භාර රාජ්‍ය අමාත්‍ය ෂෙහාන් සේමසිංහ මහතා වෙත ලබා දීමට නියමිත අතර වාර්තාවේ සඳහන් කරුණු අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට අපේක්ෂා කෙරේ.

මාධ්‍ය ඒකකය,
සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය,
ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය.